(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 14(1).]

# පාර්ලිමේන්තුවේ අංක 14 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2015 මැයි මස 08 වැනි සිකුරාදා

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 307/'15

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු මනුෂ නානායක්කාර මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු ජානක බණ්ඩාර මහතා

ගරු පී. පියසේන මහතා

ගරු වයි. ජී. පද්මසිරි මහතා

ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා

ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය

ගරු කමලා රණතුංග මෙනෙවිය

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු තිස්ස කරල්ලියද්ද මහතා

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු සරත් කුමාර ගුණරත්න මහතා

ගරු ජයසිංහ බණ්ඩාර මහතා

ගරු ජේ. ශ්‍රී රංගා මහතා

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු නිර්මල කොතලාවල මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු සරණ ගුණවර්ධන මහතා

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා

ගරු කනක හේරත් මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා

ගරු ජේ. ආර්. පී. සූරියප්පෙරුම මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු ඒ. එම්. චාමික බුද්ධදාස මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු සී. ඒ. සූරියආරච්චි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු වික්ටර් ඇන්ටනි මහතා

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු විජය දහනායක මහතා

ගරු වී.කේ. ඉන්දික මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු හේමාල් ගුණසේකර මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු පියසේන ගමගේ මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා

ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය

ගරු ටිරාන් අලස් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු ජීවන් කුමාරණතුංග මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු ධුලිප් විජේසේකර මහතා

ගරු ගුණරත්න වීරකෝන් මහතා

ගරු දි. මු. ජයරත්න මහතා

ගරු ප්‍රභා ගනේසන් මහතා

ගරු සනත් ජයසූරිය මහතා

ගරු නියෝමාල් පෙරේරා මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,— ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතා එම ධුරයෙන් ඉවත් කළ යුතුයැයි රජයට සාමූහිකව බලකිරීමේ යෝජනාව,—

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන හෙයින්ද;

රටේ මිල සහ ආර්ථික ස්ථායිභාවය රැකගැනීමත්, මූල්‍ය පද්ධතියේ ස්ථායිභාවය තහවුරු කිරීමත් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික කාර්යභාරය වන හෙයින්ද;

එම භාරදූර කාර්යය ඉටුකිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාට සහ මුදල් මණ්ඩලයට වගකීම් පැවරී ඇති අතර, එම මණ්ඩලයේ නායකත්වය දරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා බැවින් එම ධුරය හොබවන පුද්ගලයා අතිශයින් දක්ෂ, අවංක, විශ්වාසනීය පුද්ගලයෙක් විය යුතු හෙයින්ද;

2015 ජනවාරි මස අග භාගයේදී ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා වශයෙන් සිංගප්පූරුවේ පුරවැසියෙකු සහ අග්‍රාමාත්‍යවරයාගේ සමීපතම හිතවතෙකු වන අර්ජුන මහේන්ද්‍රන් මහතා පත් කිරීමෙන් පසු, ඔහුගේ කෙටි නිල කාලය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව ඉතා දරුණු අන්දමට කෙලෙසී ඇති බැවින් ඒ තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවට සහ මුළු රටටම විශාල අපකීර්තියක්ද, පාඩුවක්ද විඳින්නට සිදුවී ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතා විසින් සිදුකරන ලද දූෂිත සහ විනිවිදභාවයෙන් තොර කටයුතුවලින් සමහරක්, එනම්,—

(1.) 2015 පෙබරවාරි මස 27 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේ, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද අවුරුදු 30 භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව අතිශයින් දූෂිත ආකාරයට, තම බෑණාගේ ප්‍රාථමික ගනුදෙනුකාර සමාගම වන පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට ලබාදීමෙන් අර්ජුන මහේන්ද්‍රන් මහතා හිතාමතාම, රජයට සහ මුළු ආර්ථිකයටම දැවැන්ත පාඩුවක් සිදුකොට තිබීම; සහ

එම ගනුදෙනුවේදී රටේ පොලී අනුපාතය, තමාගේ බෑණාගේ සමාගමේ වාසියට අනවශ්‍ය ලෙසටත්, කෘතීම ලෙසටත් වැඩි කිරීම නිසා එම සමාගමට රුපියල් කෝටි 200ක පමණ අයුතු ලාභයක් උපයා ගැනීමට ඔහු විසින් මග පාදන ලදින්, ශ්‍රී ලංකා ඉතිහාසයේ දැවැන්තම පොලී පාඩුව වන රුපියල් කෝටි 4,500ක් පමණ පාඩුවක් පසුගිය සති 6 තුළ දී පමණක් ශ්‍රී ලංකා රජයට විඳින්නට සිදුවීමත් ඊට අමතරව, අර්ජුන මහේන්ද්‍රන් මහතාගේ ප්‍රෝඩාකාරී ක්‍රියාව නිසා මුළු මූල්‍ය පද්ධතියේම සමස්ත පොලී අනුපාතය වැඩිවූ බැවින්, මුළු මහත් ජනතාවටම රටේ උද්ධමනය අවුරුදු 6කට වැඩි කාලයක් තිස්සේ මැදි තනි ඉලක්කමක පවත්වා ගැනීමේ වාසිය අහිමිවූ බැවින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික කාර්යභාරයක් වන මිල ස්ථායිතාවය පවත්වා ගැනීමටද දරුණු පහරක් එල්ල වීම;

(2.) 2015 පෙබරවාරි මස 27 වැනි දින, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතාගේ ක්‍රියාවෙන් දූෂිත ලෙස නිර්මාණය වූ කෘත්‍රිම පොලී අනුපාතය නිසා, අනිකුත් සෑම පොලී අගයකටම බලපෑමක් ඇතිවූ බැවින්, එදිනට පෙර තිබූ සියලුම පොලී අගයන් සමග සසඳන විට පොලී අනුපාත 30% පමණ ප්‍රතිශතයකින් වැඩිවූ බවත්, මෙසේ සමස්ත මූල්‍ය පද්ධතියේම පොලී අනුපාතය වැඩිවීමෙන් ව්‍යාපාරිකයන්, කල් බදු ගෙවන්නන්, නිවාස තනන්නන් ඇතුළු සියලු ණය ලබාගන්නන්ගේ පොලී අනුපාතයන්ද අනවශ්‍ය ලෙස වැඩිවීම මගින් අප රටවැසියන් විශාල සංඛ්‍යාවකට ඉහළ පොලී ප්‍රමාණයක් ගෙවන්නට සිදුවීමෙන්, සමස්ත බැංකු සහ බැංකු නොවන ආයතනවල බොල් ණය ප්‍රමාණය ඉදිරි සති සහ මාස කිහිපය තුළදී ඉහළ යාමේ දැවැන්ත අවදානමක් හටගෙන ඇති අතර, එම තත්ත්වය කරනකොට ගෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙක් මූලික කාර්යභාරය වන මූල්‍ය පද්ධතියේ ස්ථායිභාවය රැක ගැනීමත් අද වනවිට විශාල අභියෝගයකට ලක්වී තිබීම;

(3.) 2015 ජනවාරි මස අග භාගයේදී මුදල් අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (International Monetary Fund) සමග කරන ලද සාකච්ඡාවලින් පසුව, දින කිහිපයකින් එම අරමුදලෙන් ඇමරිකානු ඩොලර් කෝටි 400ක පමණ මුදලක් ලබාගැනීමට ශ්‍රී ලංකා රජයට හැකිවන බව පැවසූ නමුත්, එවැනි කිසිදු මුදලක් ශ්‍රී ලංකාවට ලබාදීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සූදානම් නොමැති බව එම අරමුදලේ ඉහළ පෙළේ නිලධාරීන් ඊට දින කිහිපයකට පසුව ප්‍රවෘත්ති සාකච්ඡාවකදී ප්‍රකාශකොට ඇති බවත්, මින් පෙනීයන්නේ මුළු රටම ද, අනෙකුත් විදේශ ගනුදෙනුකරුවන් සහ ආයෝජකයන් ද නොමග යැවීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාත්, මුදල් අමාත්‍යවරයාත් උත්සාහ කොට ඇති බව වන හෙයින්

ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය කෙරෙහි ඇති ජාත්‍යන්තර විශ්වාසය සැහෙන අන්දමට පළුදු වීම;

(4.) 2015 පෙබරවාරි මාසයේ මුල් සතියේදී පමණ, මුදල් අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා මාධ්‍යයන්ට ප්‍රකාශ කරනු ලැබුවේ ඉතා නුදුරු අනාගතයේදී ඇමරිකානු ඩොලර් කෝටි 150ක පමණ මුදලක් ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරයක් (International Sovereign Bond) නිකුත් කිරීමෙන් ලබා ගැනීමට රජය සූදානම් බව නමුත්, අද වනවිටත්, එනම් සති 12ක් පමණ කාලයකට පසුවත්, එවැනි කිසිදු ජාත්‍යන්තර බැඳුම්කරයක් නිකුත් කිරීමට ඔවුන් සමත් වී නැති බවත්, මේ පිළිබඳව ජාත්‍යන්තර ආරංචි මාර්ග පවසා තිබෙන්නේ මුදල් අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා සම්බන්ධයෙන් ඇති දූෂණ සහ අක්‍රමිකතා චෝදනා හේතුවෙන්, එවැනි ජාත්‍යන්තර බැඳුම්කරයක් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් නිකුත් කිරීමට ඔවුන්ට බාධා ඇති බවත්, මෙසේ රජයට සහ ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ මුදල් ලබාගැනීමට නොහැකිවීම නිසා, අද වනවිට ශ්‍රී ලංකාවේ විදේශීය සංචිත ප්‍රමාණය විශාල අවදානමකට මුහුණ දී තිබීම;

(5.) ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය යටතේ පවතින ශ්‍රී ලංකාවේ විදේශ සංචිත 2014.12.31 දින වනවිට ඇමරිකානු ඩොලර් කෝටි 820ක අගයක පැවති බවත්, එහෙත් ඉහත කී (3) සහ (4) කරුණු නිසා, අද වනවිට එම අගයේ ඉතා දැවැන්ත කඩා වැටීමක් වාර්තා කරමින්, ඇමරිකානු ඩොලර් කෝටි 680 දක්වා අඩුවී ඇති බවට වාර්තාවී ඇති නිසා විදේශ ගනුදෙනු කිරීමේදී අප රට කෙරෙහි 2014 දී තිබූ ඉහළ විශ්වාසය මෙම රජයේ මුදල් අමාත්‍යවරයාගේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාගේ අදූරදර්ශීභාවය සහ අදක්ෂතාවය නිසා අද වනවිට සැහෙන අඩු මට්ටමකට වැටී තිබීම තුළින් රටට ගලා එන ආයෝජන පිළිබඳව අවිනිශ්චිතභාවයක්ද හටගෙන ඇති අතර, මුළු විදේශීය ගනුදෙනු වෙළඳපොළ ම කම්පාවට පත්වී ඇති නිසා අප රටෙහි විදේශ ආයෝජන පිටතට ගලා යාමේ තත්ත්වයක්ද ඉදිරියේදී ඇතිවීමේ පදනමක් ගොඩ නැගෙමින් පැවතීම;

(6.) අප රටේ විදේශ සංචිත ප්‍රමාණය මෙලෙස ශීඝ්‍ර ලෙස අඩුවීම නිසා හටගෙන ඇති අවිනිශ්චිතභාවය ඔස්සේ, 2014.12.31 දින ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රු. 130.50ක් පමණ අගයකට ගනුදෙනු වූ ශ්‍රී ලංකා රුපියල, අද වන විට රු. 132.50 ක පමණ මට්ටමකට ඇද වැටී ඇති අතර, ඉන් පෙනී යන්නේ පසුගිය දින 100 තුළදී පමණක් ශ්‍රී ලංකාවේ රුපියලේ අගය 1.5% පමණ අගයකින් පිරිහී ඇති බවත්, ඒ අතරම, විදේශ විනිමය වෙළෙඳපොළේ (Foreign Exchange Market) ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණවීම නතර කරන්නට නොහැකිවූ නිසා, රජයේ විදේශ ණය ප්‍රමාණයේ දේශීය අගයද විශාල ලෙස වැඩිවී ඇති බැවින් ඒ කරණකොට ගෙන, රටේ මුළු ණය ප්‍රමාණය මේ වනවිට අමතර රුපියල් කෝටි 4,500ක පමණ අගයකින් ඉහළ ගොස් ඇති බවත්, මෙයින් තවදුරටත් රුපියල අවප්‍රමාණ වුවහොත්, ඒ නිසා සිදුවන රාජ්‍ය ණය ප්‍රමාණය වැඩිවීම ඔස්සේ ශ්‍රී ලංකාවට දරුණු ණය අභියෝගයකටද මුහුණ දීමට සිදුවන බව පැහැදිලිවීම;

(7.) ඉහත පෙන්වා දී ඇති ක්‍රියා නිසා අග්‍රාමාත්‍යවරයාත්, මුදල් අමාත්‍යවරයාත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාත් පිළිබඳව දිනපතාම වර්ධනය වන අවිශ්වාසය තුළින්, කොළඹ කොටස් වෙළෙඳපොළද ශීඝ්‍ර ලෙස කඩා වැටී තිබීමත්, ඒ හරහා පසුගිය දින 100 තුළදී පමණක් ශ්‍රී ලංකා සමාගම්වල වෙළෙඳ ප්‍රාග්ධනය (Market Capitalization) රුපියල් කෝටි 2,000 ට වඩා අගයකින් මේ වනවිටත් පහත වැටී ඇති බව ඇස්තමේන්තු කොට තිබීම;

යනාදී වශයෙන් වන හෙයින් ද;

ඉහත දක්වා තිබෙන කරුණු අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතා එකී භාරදූර, ගෞරවාන්විත තනතුරට සුදුසු තැනැත්තෙකු නොවන බව ඔහුගේ භාවිතය තුළින්ම පෙන්වා ඇති හෙයින් ද;

ඔහු එක්සත් ජාතික පක්ෂයේ යම් යම් දේශපාලනික හා වෙනත් පෞද්ගලික අරමුණු සපුරා ගැනීමට ප්‍රයත්න දරා ඇති හෙයින්; සහ

ඔහුගේ ක්‍රියාමාර්ග, නියමයන් හා හැසිරීම් හේතුවෙන් ශ්‍රී ලංකා රජයට හා ජාතික ආර්ථිකයට බලවත් හානියක්, අලාභයක් සහ අපකීර්තියක් සිදුවී ඇති හෙයින්ද

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, අර්ජුන මහේන්ද්‍රන් මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයෙන් වහා ඉවත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.